රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව,
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 16 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

(අ) 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රු.218,840 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වැඩිපුර ගෙවා ඇතත් එම වැඩිපුර ගෙවීම් ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.7,323,038 ක් වූ උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමෙන් එම ප්‍රමාණයෙන් අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණු අතර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් ලැබුණු රු.12,049,808 ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමෙන් එම ප්‍රමාණයෙන් අතිරික්තය වැඩියෙන් දක්වා තිබූ අතර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2015 ජුනි 15 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබී ඇති රු.178,710 ක් වටිනා ධූමායන යන්ත්‍රය යන්ත්‍ර සූත්‍ර යටතේ ගිණුම්ගත නොකිරීම නිසා යන්ත්‍ර සූත්‍ර වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ මුල් මාස 3 ක ගෙවීම් වවුචර් අනුව රු.121,202 ක් වූ ණයහිමියන් අඩුවෙන් ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) 2013 වර්ෂයේ සිට හිගව පවතින රු.87,789 ක කඩකුලී පොත් වලින් කපා හැරීමට 2015 ජනවාරි 19 දින සභා අනුමැතිය ලැබී ඇතත් ඒ අනුව කටයුතු නොකිරීමෙන් හිඟ කඩකුලී එම ප්‍රමාණයෙන් වැඩියෙන්දක්වා තිබුණි.

(උ) රු.265,440 කට මිලදී ගත් කසල කරත්ත 06 ක් මෝටර් රථ හා කරත්ත ගිණුම යටතේ ගිණුම්ගත නොකිරීම නිසා මෝටර් රථ හා කරත්ත ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) 2015 වර්ෂයේ මිලදී ගෙන ඇති රු.177,510 ක් වටිනා ලීබඩු හා සවිකිරීම් ගිණුම්ගත නොකිරීම නිසා ලීබඩු හා සවිකිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස රු. 27,005,095 ක් ගිණුම් වලින් දක්වා තිබුනද, ඒ සඳහා උපලේඛන ගිණුම සමග ඉදිරිපත් කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව අක්කර 15 පර්චස් 12 ක් වූ ඉඩම් කට්ටි 08 ක නිවැරදි වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබූ අතර, තවත් ඉඩම් කට්ටි 50 ක තිබූ වටිනාකමක් ගිණුම් මගින් දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

-----------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාල මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.28,195,173 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.22,243,290 ක් වූයෙන් වෙනස රු. 5,951,883 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------------

2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.18,981 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.27,888,932 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.4,072,164 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.19,927,145 ක් වූ අතර , අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.9,938,463 ක් විය.

1.3.5 නීති රීති ,රෙගුලාසි වලට අනුකූල නොවීම.

--------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ <u>තීරණවලට යොමුව</u> | <u>අනුකූල නොවීම්.</u> |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i)මු.රෙ.387 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 2 ක අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. |
| (ii) මු.රෙ.396 (ඇ) | මාස 06 ක කාලයක් ඉක්මවූ රු.40,097ක කල් ඉකුත් වූ චෙක්පත් 15 කට අදාලව යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) ii පරිච්ඡේදයේ 13.7 වගන්තිය හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සීඑල්/97/2015 හා 2015 සැප්තැම්බර් 30 දිනැති චක්‍රලේඛය | යම් තනතුරක රාජකාරි ආවරණය කිරීමට පත්කර ඇති විට ඒ සඳහා අතිරේඛ පාරිශ්‍රමික ලැබීමට හිමිකම් නොමැති වුවත් සභාවේ වැඩ බලන ලේකම්වරයාට රු.10000 ක මාසික දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී තිබුණි. |
| (ii) xxi පරිච්ඡේදයේ 1.1 උප වගන්තිය හා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 05/2013 | රාජකාරියේ යෙදී සිටින විට කවර සේවයක යෙදී සිටින අයදැයි පහසුවෙන් හඳුනාගත හැකි විය යුතු නිලධාරීන්ට නිල ඇඳුම් නිකුත් කල හැකි වුවද, නිල ඇඳුම් ලබාගත් නිලධාරීන් එම ඇඳුම් නොපළඳින බව 2015 නොවැම්බර් 19 දින කරන ලද ස්ථානීය පරික්ෂාවේදී නිරීක්ෂණය වූ අතර 2015 වර්ෂයේ රු.203,545 ක් ගෙවා තිබුණි. |
| (ඇ) සබරගමුව පළාත් මුල්‍ය රීති සංග්‍රහයේ මුල්‍ය රීති 261.2.2 | 2015 වර්ෂයේ ගෙවා තිබූ රු.305,385 ක් වූ අත්තිකාරම් 2016 අප්‍රේල් 22 දින වන විටත් පියවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,928,231 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු.2,567,191 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,361,040 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,361,040 ක වර්ධනයට ආදායම් විෂයයන් 04 ක වර්ධනය හා වියදම් විෂයයන් 05 ක අඩුවීම බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය
-----------------------

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය
----------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම | 2015.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 2,417 | 533 | 1,966 | 1,063 | 1,884 | 903 | 2,787 |
| බදු කුලී | 2,664 | 611 | 6,501 | 5,087 | 2,053 | 1,414 | 3,467 |
| බලපත්‍ර ගාස්තු | 80 | 01 | 166 | 166 | 79 | - | 79 |
| වෙනත් ආදායම් | - | - | 2,077 | - | - | - | - |

ඉහත හිඟ ආදායම් වාර්තා මුලාා ප්‍රකාශණ සමග සැසඳීමේදී පහත පරිදි වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් ප්‍රභවය | අවසන් ගිණුම අනුව ශේෂය | හිඟ ආදායම් වාර්තාවට අනුව ශේෂය |
|---|---|---|
| | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 3,236 | 2,787 |
| බදු කුලී | 6,352 | 3,467 |
| බලපත්‍ර ගාස්තු | 364 | 79 |

### 2.3.2 වරිපනම් බදු

වර්ෂ 04 කට වැඩි කාලයක් තුළ වරිපනම් බදු ගෙවීම පැහැරහැර ඇති දේපොල හිමියන් ගෙන් අයවිය යුතු රු. 269,039 ක වරිපනම් බදු මුදල් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත158 (1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.3 ව්‍යාපාර බදු

සභා බල ප්‍රදේශයේ සේවා සපයන ආයතන වලින් ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.4 වෙනත් ආදායම්

(අ) ආදායම් වර්ග 10 ක 2015 ජනවාරි 01 දිනට පැවති රු. 5,161,293 ක හිඟ ශේෂයෙන් 2015 ඔක්තෝබර් 31 දිනට රු.932,240 ක් පමණක් අයකර තිබුණි. හිග ශේෂ අයකිරීම 18% ක් වැනි ඉතා පහල මට්ටමක පැවතුණි.

(ආ) සභා සීමාව තුළ රථවාහන නැවතුම් පොලවල් සඳහා නිශ්චිත ස්ථාන හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු නොකිරීමෙන් ලබාගත හැකි ආදායම් අහිමිවී තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරන දැනවීම් පුවරු හා බැනර් සඳහා ගාස්තු අයකර නොතිබුණු අතර විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු සඳහාද ගාස්තු අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------------

(අ) සභාවේ තනතුරු 08 ක නිලධාරීන් 18 ගේ ඌනතාවයක් හා තනතුරු 4 ක පුද්ගලයන් 19 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. කම්කරු තනතුරු 04ක් සඳහා අනුමත ප්‍රමාණය ඉක්මවා සිටියදී කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයන් 21 දෙනෙකු බඳවාගෙන තිබුණි. සභාවේ මුදල් භාර ගැනීම, බැංකුගත කිරීම කාර්යාල කාර්ය සහායක තනතුරක් දරන පුද්ගලයෙකුට පවරා තිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව සභාවක ලේකම් තනතුරු සඳහා යෝග්‍ය නිලධාරියෙකු පත්කළයුතු වුවත් වැඩ ආවරණය කිරීමට සුදුසු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකු සිටියදී කණිෂ්ඨ නිලධාරිනියක පත්කර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

(අ) සභාවේ පොදු වෙළඳපල භූමියේ කඩකාමර 17 කින් සමන්විත බිම් මහල සහිත දෙමහල් ගොඩනැගිල්ල ගොඩනැගිලි ඉදිකිරීම් සීමාව නොසලකා ඉදිකිරීම සඳහා සභාපතිවරයා අනුමත කර තිබුණි.

(ආ) නගර සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී වෙළඳසැල් අහිමි වූ පුද්ගලයන්ට අලුතින් ඉදිකරන කඩකාමර ලබාදීමට 2013 අප්‍රේල් මාසයේ මහා සභාව තීරණය කර තිබුණද පැරණි කඩකුලී ලේඛනයේ නම් ඇතුළත් නොවූ පුද්ගලයන් 06 දෙනෙකුගෙන් "එක්වන් මුදල්" ලබාගෙන තිබුණි. බිම් මහල සහිත මහල් දෙකකින් යුතු මෙහි බිම් මහල පමණක් ඉදිකිරීම් අවසන් කර තිබුණද 2013 ජුනි 14 දින සිට ඉදිකිරීම් අධිකරණය විසින් තහනම්කර තිබුණි.

(ඇ) පෙම්සිසිගම උදාකළ ගම්මානයේ ඉඩම හා ප්‍රජාශාලාව 1987 පෙබරවාරි 03 දින නිවාස සංවර්ධන අධිකාරිය විසින් සභාවට පවරා දී තිබුණද නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. පැරණි ප්‍රජාශාලා ගොඩනැගිල්ල හා සමරු ඵලකය ද ඉවත් කර තිබූ අතර, නව ගොඩනැගිල්ලක් පළාත් සභා අරමුදල් භාවිතා කර ඉදිකර තිබුණි. මෙම භූමියේ පස් විශාල ප්‍රමාණයක් කපා ඇති අතර යාබද ඉඩමට පිවිසුම් මාර්ගයක් මෙම ඉඩම හරහා සකසා ගෙන තිබූ නමුත් ඒ ගැන සොයාබලා කටයුතු කර නොතිබුණි.

(ඈ) පැරණි JBC යන්ත්‍රය සඳහා 2015 ජනවාරි සිට ජූලි 07 දක්වා භාවිතා කළ ඉන්ධන ලීටර් 3,047.8 ක ප්‍රමාණය අනුව මීටර් පැය 507.96 ක් සේවයේ යොදවා ඇතත් මීටර් පැය 44.4 ක් සඳහා රු. 87,000 ක ආදායමක් පමණක් ලබාගෙන තිබුණි. ඒ අනුව මීටර් පැය 463.56 ක් සඳහා රු.908,327 ක අදායමක් අහිමි වී තිබුණි. නව JBC යන්ත්‍රයට ඉන්ධන ලීටර් 189,227 ක් යොදා ඇති අතර එයින් මීටර් පැය 252.16 ක් සේවයේ යෙදවිය හැකි වුවත් මීටර් පැය 50.8 ක් සඳහා රු.102,075 ක ආදායමක් පමණක් ලැබී තිබුණි. මීටර් පැය 201.3 ක ආදායම සභාවට අහිමි වී තිබුණි.

(ඉ) 2015 වර්ෂය තුළ මහා මාර්ග අමාත්‍යාංශයෙන් , ප්‍රධාන අමාත්‍යාංශයෙන් , පරිසර අධිකාරියෙන් හා පළාත් සභාවෙන් ලැබී තිබූ ප්‍රතිපාදන පොදු තැන්පත් ගිණුම හරහා වැය කිරීම් කර තිබූ අතර, රු.2,429,781 ක් ඉතිරිවී තිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියේ විධිවිධාන වලට පටහැනි ලෙස රු.1,020,000 ක පළාත් සභා අරමුදල් හා සභා අරමුදල් රු.500,000 ක් වැයකර පිළිවෙලින් 2015 ජූලි 22 හා 2015 මැයි 15 දින හියුම් පයිප්ප 600 ක් මිලදී ගෙන තිබූ නමුත් 2015 නොවැම්බර් 19 දින වන විටත් 505 ක් ඉතිරි වී තිබුණි. මෙම හියුම් පයිප්ප මිලදී ගැනීම් හා බෙදා හැරීම් තොග පොත් වල ඇතුළත් කර නොතිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

(අ) කොරියානු පාරිසරික සංවිධානය මඟින් කසල ජනනය වන ස්ථානයේදීම වෙන්කර එකතුකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,417,917 ක අත්තිකාරමක් සභාවට ලබාදී තිබුණ අතර එහි දෙවන අදියර 2014 මැයි වන විට අවසන් කර 2015 මාර්තු 31 ට පෙර අදාල බිල්පත් පළාත් පාලන අමාත්‍යාංශය වෙත යැවිය යුතු බව දන්වා තිබුණද රු. 1,013,566 ක වියදම් සඳහා බිල්පත් 2015 නොවැම්බර් 19 වන විටත් ප්‍රතිපූරණය සඳහා යවා නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියා මාර්ග අනුගමනය කළයුතු වුවත් රු.33,470 ක් වටිනා මිලදී ගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය සඳහා රු.166,250 කට 2014 ජූලි 30 මිලදී ගත් කහපාට හා කොලපාට මලු 500 න් මලු 240 ක් හා 2014 දෙසැම්බර් 30 දින රු.144,450 ක් මිලදීගත් ප්ලාස්ටික් බඳුන් 270 න් 168 ක් 2015 නොවැම්බර් 19 වන විටත් බෙදා නොමැතිව ගබඩා කර තිබුණි.

4.4.1 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

4.1 වත්කම් කළමනාකරණය

-----------------------------

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩ සටහන යටතේ රු.36,381,805 ක් වැය කර ඉදිකර තිබූ රුවන්වැල්ල සතිපොල 2015 ජනවාරි 15 දින ප්‍රාදේශීය සභාවට භාර දී ඇතත් 2015 නොවැම්බර් 19 දින දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්

------------------------------------

2016 මැයි 16 දින වන විට විගණන විමසුම් 06 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු. 9,179,956 ක් විය.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය